# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 ජූනි මස 19 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.45 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක කුරුප්පු
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මෙරිල් පෙරේරා
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උපාලි ගුණරත්න
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්දන්
එස්.එම්. සකාවුල්ලා
කාමල් කුරුප්පු
කිත්සිරි මංචනායක
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්ද්‍රසෝම සරණලාල්
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නිරෝෂන් පාදුක්ක
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මංජුල බුද්ධදාස
මොරිස් විජේරත්න
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
ලයනල් ජයසිංහ
සරත් පතිරණ
සලෝචන ගමගේ
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින වෘත්තීය ක්‍රියාමාර්ගයක් හේතුකොටගෙන ඇතැම් මන්ත්‍රීවරුනට අද දින සභා න්‍යාය පත්‍රය නොලැබී තිබෙන්නට පුළුවන් බවත්, එම නිසා න්‍යාය පත්‍රයේ අමතර පිටපතක් සෑම ගරු මන්ත්‍රීවරයෙකුගේම සභා මේසය මත තබා තිබෙන බව කාරුණිකව දැනුම් දෙන බවත්, දුරකථනය මඟින් ද මේ පිළිබඳව දැනුවත් කිරීමක් කර තිබෙන බවත්, එමෙන්ම කිසියම් මන්ත්‍රීවරයෙකුට යම් අපහසුතාවයක් වූයේ නම් ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කර සිටින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"පළාත් සභා මන්ත්‍රී නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාව අද සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සමාජිකයෙකු ලෙස තමා විසින් පත් කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***iii***

*"ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව සඳහා යෝජිත අපජල කළමනාකරණ ව්‍යාපෘතිය පිළිබඳව බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් සහ කොළඹ දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඉල්ලීමක් කර ඇති බවත්, එම දැනුවත් කිරීම සඳහා සභා රැස්වීම් දින සවස පැමිණිය හැකි බව දැනුම් දී ඇති බවත්, ඒ අනුව අද සභා රැස්වීමෙන් පසුව පව. 02.00 ට පළාත් අදායම් දෙපාර්තමේන්තු රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන එම දැනුවත් කිරීමේ සාකච්ඡාවට සහභාගි වන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙතත්, කොළඹ දිස්ත්‍රික්කයේ ගරු අමාත්‍යවරුන් වෙතත්, කොළඹ දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරුන් වෙතත් ඇරයුම් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***iv***

*"කාර්ය පටිපාටි රීති කාරක සභාව විසින් බලවත් පරිශ්‍රමයෙන් යුක්තව පිළියෙල කරන ලද කාර්ය පටිපාටි රීති පුස්ථකය 2018 මැයි මස 08 වන දින සභාගත කරමින් බලාත්මක කළ බවත්,*

*එකී පුස්ථකය ඉතාමත් ආකර්ෂණීය විධියට සහ සාරගර්භ ආකාරයෙන් සකස් කොට අද දින ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරුන්ටත්, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ධුරධාරීන්ටත් පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් මේ මොහොතේ ලබා දීමට කටයුතු සලස්වා තිබෙන අතර, මෙම පුස්තකය කොටස් දෙකකින් යුක්ත වන අතර, සිංහල - ඉංග්‍රීසි සහ දෙමළ - ඉංග්‍රීසි ලෙස ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය භාෂාවෙන් එක් පොතක් පමණක් ලබා ගැනීමට හැකි බව දන්වා සිටින බවත්,*

*මෙම පොත සකස් කිරීමේදී මම සභාපතිත්වය දරන කාර්යපටිපාටි රීති කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන් සියලුම දෙනාම බෙහෙවින් උපකාර වූ අතර ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා මන්ත්‍රීතුමාගේ දායකත්වය ඒ සඳහා හිමි වීම ග්‍රන්ථයට අගනා වටිනාකමක් ද ඇති කර තිබෙන බවත්,*

*පොතේ අන්තර්ගතය බැලූ විට, පළමුව කාර්යපටිපාටි රීති මාලාව ඇතුළත් වන අතර අනතුරුව පරිශිෂ්ටය මෙන්ම, රීති පොතෙන් උපුටා දක්වන රීතීන් හා බැඳුණු ඇතැම් වගන්ති සඳහා විශේෂයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ අදාළ වගන්ති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ වගන්ති පමණක් මීට අමුණා ඇත. එමෙන්ම, කාර්ය පටිපාටි රීති පුස්ථකයට පළමුවර මෙම ලේඛන ඇතුළත් කර ඇති අතර, විශේෂයෙන් **index** එකක්, සුවිශේෂ වදන් සඳහා අංකන ඇතුළත්ව ගරු මන්ත්‍රීවරුන්ට නිතර අවශ්‍ය වන වැදගත් රීති හා බැඳුණු වදන් පෙළ ගැසීමක් එනම් සුචියක් ද මේ සමග අමුණා තිබෙන බවත්,*

*හැකි උපරිමයෙන් ගරු මන්ත්‍රීවරුන්ට පහසුව ගෙන එන පරිදි නව රීති පොත සකස් කිරීමට උත්සාහ ගෙන ඇත. ඒ සඳහා සභා ලේකම් හේමන්ත සමරකෝන් මහතා මාගේ උපදෙස් පරිදි සියලු කටයුතු සංවිධානය කළ අතර, විශේෂයෙන් සභා ලේකම්තුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයේ, විශේෂයෙන් පළාත් සභාවේ හැන්සාඩ් සංස්කාරක එච්.ජී. වරුණ ගුණරත්න මහතාටත්, හැන්සාඩ් වාර්තාකරු චන්ද්‍රිකා කුමාරි මහත්මිය ඇතුළු හැන්සාඩ් අංශයේ සියලු නිලධාරීනියන්ටත්, මුද්‍රණය කිරීම, ඒ හා බැඳුණු කටයුතු ඉටු කළ ප්‍රධාන ආරච්චිල මංජුල පද්මකුමාර, අනුර සසංක, අජිත් පෙරේරා, චූලක ඩයස්, නිලූක සංජීව, චතුර සම්පත් සහ නෙවිල් සෙනෙවිරත්න යන මහත්වරුන් ඇතුළු සියලුම දෙනාටත් දෙමළ හා ඉංග්‍රීසි භාෂා පරිවර්තනය කළ සියලුම නිලධාරීන්ටත් ස්තුතිය පළ කර සිටින බවත්,*

*විශේෂයෙන් මෙම රීති පොත පමණක් සභාවේදී භාවිතා කරන ලෙස ඉල්ලා සිටිනවා. මීට පෙර නොවෙයක් අයුරින් නොයෙක් අවස්ථාවලදී ලබා දුන් රීති පොත් පරිශීලනය නොකරන ලෙසත්, යම් රීතියක් උපුටා දැක්වීමේදී මෙම රීති පොතම පරිශීලනය කිරීම සෙසු ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මූලාසනයටත් ඉතාම පහසුවක් වන අතර, සීමිත පොත් ප්‍රමාණයක් මෙලෙස සකස් කර ඇති බැවින්, නැවත මෙවන් පොතක් නිකුත් කිරීමට හැකියාවක් නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2018.06.06 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සභාවට පිළිගන්වන ලදී.

***පූ.භා. 10.45 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදුව, අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"වර්තමානයේ වැඩිහිටියන්ගේ සිට කුඩා ළමයා දක්වා බෝ නොවන රෝගවලින් පෙළෙන අතර එකී රෝග සීඝ්‍රයෙන් වැඩිවීමේ ප්‍රවණතාවක් ඇත. මෙම තත්ත්වය දිගින් දිගටම වර්ධනය වීමට හේතු ලෙස රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාරපාන භාවිතය සහ තාක්ෂණික මෙවලම් භාවිතයට හුරුවීම නිසා මිනිස් සිරුරට ව්‍යායාම් අඩුවීම ද හඳුනාගෙන ඇත. මේ රටේ අනාගතය භාර ගැනීමට සිටින ළමා පරපුර මෙම උපද්‍රවයෙන් බේරා ගැනීමට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාසැල් මට්ටමෙන් වැඩ පිළිවෙළක් දියත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II

න්‍යාය පත්‍රයේ පෞද්ගලික යෝජනා II වන නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාව, ඊළඟ සභාවට යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදුව, සභා සම්මත විය.

## 05. කල් තැබීමේ යෝජනාව :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.28 ට, 2018 ජූලි මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.06.19
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කුමා/19